
# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව


**2022 ජනවාරි**
**04 වෙළුම 01 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2022 වසරේ ජනවාරි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,101ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 17.5කින් ඉහළ ගියේය.

2022 වසරේ ජනවාරි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,959ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 23.1කින් ඉහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)





2022 වසරේ ජනවාරි මාසය තුළ දී අපනයන ආදායම සහ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 17.5කින් සහ සියයට 23.1කින් ඉහළ ගියේය.

වෙළඳ ගිණුමේ හිඟය, 2021 වසරේ ජනවාරි මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 655ට සාපේක්ෂව, 2022 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 859ක් දක්වා වැඩි විය.


## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2022 ජනවාරි)

**අපනයන (එ.ජ. ඩොලර් මිලියන)** | **ආනයන (එ.ජ. ඩොලර් මිලියන)**




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - ජනවාරි




### අපනයන පරිමා හා මිල දර්ශක - ජනවාරි





කාර්මික, කෘෂිකාර්මික සහ ඛනිජමය අපනයන ඇතුළු ප්‍රධාන කාණ්ඩවල අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ ජනවාරි මාසය තුළ දී අපනයන ආදායම, 2021 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව ඉහළ ගියේය.


පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව, 2022 වසරේ ජනවාරි මාසය තුළ දී අපනයන පරිමා දර්ශකය සියයට 20.1කින් ඉහළ ගිය අතර, මිල දර්ශකය සියයට 2.2කින් පහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජනවාරි)





### තේ සහ රබර් මිල ගණන් *





ප්‍රධාන වශයෙන්, පොල්, මුහුදු ආහාර, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, පුවක්) සහ රබර් අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ ජනවාරි මාසය තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සුළු වශයෙන් ඉහළ ගියේය. කෙසේ වුවත්, තේ සහ කුළුබඩු අපනයන ආදායම පහත වැටුණි.

## කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජනවාරි)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2022 වසරේ ජනවාරි මාසය තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජතෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවත්, පිහන්මැටි නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය.

## ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - ජනවාරි





### ආනයන පරිමා හා මිල දර්ශකය - ජනවාරි





සියලුම ප්‍රධාන කාණ්ඩවල, විශේෂයෙන්ම අන්තර් භාණ්ඩ ආනයන වියදම්වල ඉහළ යෑම හේතුවෙන්, පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව 2022 වසරේ ජනවාරි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, 2022 වසරේ ජනවාරි මාසය තුළ දී ආනයන පරිමා දර්ශකය සහ මිල දර්ශකය පෙර වසරට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 2.3කින් සහ සියයට 20.3කින් ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජනවාරි)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ප්‍රධාන වශයෙන්, ධාන්‍ය සහ ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, සහල්), බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත, කිරි නිෂ්පාදිත, සහ රෙදිපිළි හා උපාංග ඇතුළු ආහාර සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන කාණ්ඩ දෙකෙහිම වැඩිවීම හේතුවෙන් 2022 වසරේ ජනවාරි මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඉහළ ගියේය. සීනි සහ රසකැවිලි, විදුලි සංදේශ මෙවලම්, තෙල් හා මේද සහ එළවළු, ආනයන වියදම් පහළ ගිය කාණ්ඩ අතරට අයත් වේ.

# අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජනවාරි)




බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)





*2021 වසරේ මාර්තු, ජූනි,සැප්තැම්බර් සහ නොවැම්බර් මාසවල බොරතෙල් ආනයනය කර නැත.


ප්‍රධාන වශයෙන්, ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග (ප්‍රධාන වශයෙන්, රෙදි), මූල ලෝහ (ප්‍රධාන වශයෙන්, යකඩ හා වානේ), සහ තිරිඟු ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ ජනවාරි මාසය තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වුව ද, 2022 වසරේ ජනවාරි මාසය තුළ දී ආහාර සැකසුම් (ප්‍රධාන වශයෙන්, පාම් තෙල්), කෘෂිකාර්මික යෙදවුම් (ප්‍රධාන වශයෙන්, සත්ත්ව ආහාර), පොහොර සහ රථවාහන හා යන්ත්‍රෝපකරණ කොටස් ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජනවාරි)




ගොඩනැගිලි ද්‍රව්‍ය සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ ජනවාරි මාසය තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවත්, ප්‍රවාහන උපකරණ ආනයන වියදම පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | ජන. -දෙසැ. 2020 | ජන.-දෙසැ. 2021 | වෙනස (%) | ජන.- 2021 | ජන.- 2022 (අ) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **2,336.2** | **2,729.5** | **16.8** | **199.9** | **204.5** | **2.3** |
| එයින් | තේ | 1,240.9 | 1,324.4 | 6.7 | 101.0 | 91.2 | -9.7 |
| | පොල් | 345.2 | 425.2 | 23.2 | 24.2 | 33.3 | 37.9 |
| | කුළුබඩු | 333.5 | 454.8 | 36.4 | 42.0 | 35.0 | -16.7 |
| | මුහුදු ආහාර | 189.8 | 274.1 | 44.4 | 16.9 | 24.1 | 42.6 |
| **කාර්මික අපනයන** | | **7,672.0** | **9,702.0** | **26.5** | **732.3** | **890.2** | **21.6** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 4,423.1 | 5,435.1 | 22.9 | 423.0 | 516.1 | 22.0 |
| | රබර් නිෂ්පාදිත | 786.1 | 1,050.4 | 33.6 | 80.2 | 82.0 | 2.2 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 373.6 | 506.4 | 35.6 | 34.4 | 67.2 | 95.2 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 464.0 | 586.9 | 26.5 | 39.7 | 41.7 | 4.9 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 337.5 | 500.9 | 48.4 | 41.1 | 44.6 | 8.5 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 181.5 | 276.7 | 52.5 | 23.4 | 30.2 | 28.9 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 53.9 | 58.4 | 8.2 | 3.5 | 4.3 | 22.1 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **39.2** | **67.1** | **71.1** | **4.4** | **6.1** | **38.6** |
| **මුළු අපනයන** | | **10,047.4** | **12,498.6** | **24.4** | **936.7** | **1,100.9** | **17.5** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | ජන. -දෙසැ. 2020 | ජන.-දෙසැ. 2021 | වෙනස (%) | ජන.- 2021 | ජන.- 2022 (අ) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **3,401.7** | **3,848.7** | **13.1** | **345.6** | **360.0** | **4.2** |
| ආහාර හා පාන වර්ග | | 1,554.4 | 1,666.5 | 7.2 | 183.8 | 187.2 | 1.8 |
| එයින් | එළවළු (ආ) | 352.9 | 384.3 | 8.9 | 40.5 | 29.6 | -26.8 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 1,847.3 | 2,182.2 | 18.1 | 161.8 | 172.8 | 6.8 |
| එයින් | පෞද්ගලික රථවාහන | 282.9 | 12.8 | -95.5 | 0.5 | 0.7 | 31.9 |
| **අන්තර් භාණ්ඩ** | | **9,076.5** | **12,308.9** | **35.6** | **915.0** | **1,212.5** | **32.5** |
| එයින් | ඉන්ධන | 2,542.6 | 3,742.9 | 47.2 | 309.8 | 430.3 | 38.9 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,335.1 | 3,066.9 | 31.3 | 236.5 | 316.5 | 33.9 |
| | පොහොර | 258.9 | 158.2 | -38.9 | 4.7 | 2.5 | -47.3 |
| | තිරිඟු හා ඉරිඟු | 384.4 | 418.3 | 8.8 | 6.9 | 41.7 | 507.6 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **3,577.2** | **4,479.8** | **25.2** | **331.1** | **386.9** | **16.9** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,176.1 | 2,809.5 | 29.1 | 216.6 | 243.8 | 12.5 |
| **මුළු ආනයන** | | **16,055.4** | **20,637.4** | **28.5** | **1,591.6** | **1,959.4** | **23.1** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | ජන. -දෙසැ. 2020 | ජන.-දෙසැ. 2021 | වෙනස (%) | ජන.- 2021 | ජන.- 2022 (අ) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -6,007.9 | -8,138.8 | | -654.9 | -858.5 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | ජන. -දෙසැ. 2020 | ජන.-දෙසැ. 2021 | වෙනස (%) | ජන.- 2021 | ජන.- 2022 (අ) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 116.5 | 145.0 | 24.4 | 130.4 | 153.2 | 17.5 |
| | පරිමා දර්ශකය | 132.9 | 156.9 | 18.0 | 139.6 | 167.7 | 20.1 |
| | මිල දර්ශකය | 87.7 | 92.4 | 5.4 | 93.4 | 91.3 | -2.2 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 119.7 | 153.9 | 28.5 | 142.4 | 175.4 | 23.1 |
| | පරිමා දර්ශකය | 145.5 | 162.2 | 11.5 | 165.8 | 169.6 | 2.3 |
| | මිල දර්ශකය | 82.3 | 94.9 | 15.2 | 85.9 | 103.4 | 20.3 |
| **වෙළඳ මිල අනුපාතය** | | 106.5 | 97.4 | -8.6 | 108.7 | 88.4 | -18.7 |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද